## වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය

# තේ පර්යේෂණ මණ්ඩලය

## ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය

Brewing Innovations
1925 | TRI | 2025

# ඇබෑර්තු

තලවාකැලේ, ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනයේ පහත සඳහන් තනතුරු සඳහා ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## 1. අභ්‍යන්තර විගණක (Internal Auditor)

**රැකියා විස්තරය :**

ප්‍රමාණවත් පද්ධති හා වැඩපිළිවෙල ස්ථාපිත කිරීම හා අධීක්ෂණය කිරීම තුළින් අභ්‍යන්තර පාලන කටයුතු සහතික කිරීම, චර්යා රටාව අනුව හා නිරතුරුව/ හදිසියේ විමර්ශන කටයුතු හා ලේඛන, මුදල් හා ගබඩා පරීක්ෂා කිරීම යන කාර්ය සම්බන්ධයෙන් වගකීම දරයි.

**බාහිර අයදුම්කරුවන් :**

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ (ICASL) අන්තර් මධ්‍යම මට්ටමේ සුදුසුකම් හෝ වරලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනයේ (CIMA) අන්තර් මධ්‍යම මට්ටමේ සුදුසුකම් හෝ සහතික ලත් වරලත් ගණකාධිකාරීන සංගමයේ (ACCA) අන්තර් මධ්‍යම මට්ටමේ සුදුසුකම් හෝ කළමනාකරණය හෝ වාණිජ විෂය පිළිබඳ සිව් (04) වසරක ගෞරව උපාධියක්.

**සහ**

ඉහත සුදුසුකම් ලැබීමෙන් පසු රජයේ දෙපාර්තමේන්තුවක / සංස්ථාවක / මණ්ඩලයක හෝ පිළිගත් වෙළඳ ආයතනයක ගිණුම්කරණය සහ මූල්‍ය පිළිබඳ අවම වශයෙන් වසර තුනක (03) පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද.

සටහන: පරිගණකගත ගිණුම්කරණ පරිසරයක පළපුරුද්ද අතිරේක සුදුසුකමකි.

**අභ්‍යන්තර අයදුම්කරුවන් :**

අදාල ක්ෂේත්‍රයේ 1 ශ්‍රේණියේ කණිෂ්ඨ කළමනාකරණ කාණ්ඩයේ තනතුරට අදාළව අවම වශයෙන් වසර පහක (05) පළපුරුද්ද.

**සහ**

අදාළ ක්ෂේත්‍රයේ කනිෂ්ඨ කළමනාකාර වර්ගීකරණයේ 1 වන ශ්‍රේණියේ අදාළ තනතුරක අවම වශයෙන් වසර පහක (05) පළපුරුද්ද.

**වැටුප් පරිමාණය :** MM 1-2 (2025) රු. 94,170/- 10 X 2,480 - 15 X 3,450 - රු. 170,720/- මාසිකව (රු. 94,170/- ක මූලික වැටුප 2027.01.01 දින සිට ගෙවනු ලැබේ. 2026.01.01 දිනට ගෙවනු ලබන වැටුප් රු. 83,803/- වන අතර නොගෙවූ ප්‍රමාණය රු. 10,367/- වේ).

**වයස :** අවුරුදු 22 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.

**තෝරාගැනීමේ ක්‍රමවේදය :** ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්.

## 2. ඉංජිනේරු සහකාර - සිවිල් (Engineering Assistant - Civil)

**රැකියා විස්තරය :**

නේවාසික ඉංජිනේරුවරයාගේ මග පෙන්වීම යටතේ නඩත්තු කිරීම, ඉදි කිරීම, ඇස්තමේන්තුගත කිරීම, සැලසුම් කිරීම, ඉංජිනේරු අංශයේ සමස්ථ පරිපාලනය හා තාක්ෂණික කළමනාකරණය, BOQ ද්‍රව්‍ය ලැයිස්තු, පිරිවැය ඇස්තමේන්තු ගත කිරීම හා කාලානුරූපිව නේවාසික ඉංජිනේරු විසින් පවරන රාජකාරීන් ඉටු කිරීම.

**බාහිර අයදුම්කරුවන් :**

ජාතික තාක්ෂණ ඩිප්ලෝමාව - (NDT-Civil) සිවිල් හෝ ජාතික ඉංජිනේරු විද්‍යා ඩිප්ලෝමාව (NDES).

**සහ**

රජයේ දෙපාර්තමේන්තුවක / සංස්ථාවක / මණ්ඩලයක හෝ පිළිගත් වෙළඳ ආයතනයක සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර හයක (06) පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද.

**සටහන:**

සිවිල් ඉංජිනේරු සහ විදුලි බල නඩත්තු කටයුතු පිළිබඳ දැනුම අමතර සුදුසුකමක් ලෙස සැලකේ.

**අභ්‍යන්තර අයදුම්කරුවන් :**

අ.පො.ස. (උසස් පෙළ) එකවර විෂයයන් තුනක් (03) සහිතව තාක්ෂණික නිලධාරී (සිවිල්) 1 වන ශ්‍රේණියේ වසර පහක (05) සතුටුදායක සේවා කාලයක්.

**වැටුප් පරිමාණය :** JM 1-2 (2025) රු. 74,010/- 10 X 1,360 - 18 X 2,040 - රු. 124,330/- මාසිකව (රු. 74,010/- ක මූලික වැටුප 2027.01.01 දින සිට ගෙවනු ලැබේ. 2026.01.01 දිනට ගෙවනු ලබන වැටුප් රු. 66,781/- වන අතර, නොගෙවූ ප්‍රමාණය රු. 7,229/- වේ).

**වයස :** අවුරුදු 22 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.

**තෝරාගැනීමේ ක්‍රමවේදය :** ලිඛිත තරඟ විභාගයක් සහ/හෝ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්.

## 3. තාක්ෂණික නිලධාරී - ජල පෙරණ (Technological Officer - Filter Plant)

**රැකියා විස්තරය :**

ජල පවිත්‍රාගාරයේ දෛනික කටයුතු සඳහා සහභාගී වීම, පහසුකම් සැපයීම සහ තාක්ෂණික කටයුතු සඳහා කළමනාකාරීත්වයට සහය වීම.

**බාහිර අයදුම්කරුවන් :**

තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික / වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ලද, ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) මට්ටම 05 ට නොඅඩු අදාළ ක්ෂේත්‍රයේ නිපුණතා සහතිකයක් ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් :**

ඉහත බාහිර අයදුම්කරුවන් සඳහා අවශ්‍ය සුදුසුකම් ලබා තිබීම.

**වැටුප් පරිමාණය :** MA 2-2 (2025) රු. 50,540/- 10 X 540 - 7 X 630 - 4 X 1,080 - 20 X 1,280 - රු. 90,270/- (රු. 50,540/- ක මූලික වැටුප 2027.01.01 දින සිට ගෙවනු ලැබේ. 2026.01.01 දින ගෙවනු ලබන **වැටුප් ප්‍රමාණය :** රු. 46,960/- වන අතර නොගෙවූ ප්‍රමාණය රු. 3,581/- වේ).

**වයස:** අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.

**තෝරාගැනීමේ ක්‍රමවේදය :** ලිඛිත තරඟ විභාගයක් සහ/හෝ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්.

**අනෙකුත් ප්‍රතිලාභ:**

**අර්ථසාධක අරමුදල :** තේරී පත්වන අයදුම්කරු වැටුපෙන් 10% ක් සේවක අර්ථසාධක අරමුදලට දායක කළ යුතු අතර, ආයතනය 15% ක් දායක වේ. තවද ආයතනය සේවක භාරකාර අරමුදල සඳහා 3% ක් දායක වේ.

තනතුරු ස්ථිර වේ. නියමිත අයදුම්පත භාවිත කරමින්, ඥාතීන් නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ නම්, ලිපින සහ සම්බන්ධ කරගත හැකි තොරතුරු ඇතුළත් කර එවීමට කටයුතු කළ යුතුය. සියලුම සහතික පත්‍රවල සහතික කළ පිටපත් අයදුම්පත සමග අමුණා තිබිය යුතුය. අයදුම්පත ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනයේ නිල වෙබ් අඩවියෙන් (www.tri.lk) බාගත කරගත හැක.

අයදුම්පත බහා ඇති ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ තමන් අයදුම් කරන තනතුර සඳහන් කර, එය 2026 අගෝස්තු 10 දින හෝ ඊට පෙර අධ්‍යක්ෂ, ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය, ශාන්ත කූම්බ්ස්, තලවකැලේ යන ලිපිනයට එවිය යුතුය.

රජයේ දෙපාර්තමේන්තු සහ ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවකයින්ගේ අයදුම්පත් ඔවුන්ගේ ආයතන ප්‍රධානීන් මාර්ගයෙන් යොමු කළ යුතු අතර, අයදුම්කරු තේරී පත් වුවහොත් එම තනතුර භාර ගැනීම සඳහා මුදා හැරිය හැකිද යන්න ආයතන ප්‍රධානියා විසින් සහතික කළ යුතුය.

යම් අයදුම්කරුවෙකු තනතුරු එකකට වඩා වැඩි ගණනක් සඳහා අයදුම් කරන්නේ නම්, එක් එක් තනතුර සඳහා වෙන වෙනම ලියුම් කවරවල සහතික පත්‍ර පිටපත් ද සමග අයදුම්පත් ඉදිරිපත් කළ යුතු අතර, ඉහත අවශ්‍යතා සපුරා නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

වැඩි විස්තර සඳහා කරුණාකර තේ පර්යේෂණ ආයතනයේ වෙබ් අඩවිය වන www.tri.lk වෙත පිවිසෙන්න.

**අධ්‍යක්ෂ,**
**ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය,**
**ශාන්ත කූම්බ්ස්,**
**තලවකැලේ.**